# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1799/31 – 2013 මාර්තු 01 වැනි සිකුරාදා – 2013.03.01**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/07/17/2008.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2012 මාර්තු මස 19 වැනි දින අංක 1750/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012 මාර්තු මස 08 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශවයක් වශයෙන් :

ලංකා වතු සේවා සංගමය, නො. 06, ඇලෝයි මාවත, කොළඹ 03.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

01. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, නො. 28, මුදලිගේ මාවත, කොළඹ 01.

02. වතු අධිකාරි, ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය, පන්විල.

අතර පවත්නා 2012 පෙබරවාරි මස 28 වන දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිලිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එම්. ඩී. කේ. කුලතුංග මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය වන ගාමිණී ලොකුගේ වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2012 මාර්තු 08 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

03 - 711/1



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ යොමු අංකය: IR/07/17/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන් :

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

3. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01.

4. වතු අධිකාරි, ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය, පන්විල

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

පිළියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89/එෆ් හි, සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/07/17/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන් :

ලංකා වතු සේවා සංගමය, නො. 06, ඇලෝයි මාවත, කොළඹ 03.

සහ

අනෙක් පාර්ශවය වශයෙන් :

1. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01.

2. වතු අධිකාරි, ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය, පන්විල

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ගල්පිහිල්ල රාජ්‍ය වතුයායේ කණිෂ්ඨ වතු වෛද්‍ය සහකාර තනතුරෙහි සේවය කළ එස්. මාරසිංහ මහතාට ලංකා වතු සේවා සංගමය හා ලංකා සේව්‍යයන්ගේ සම්මේලනය අතර ඇති කර ගන්නා ලද 2004 අංක 13 දරන සාමුහික ගිවිසුමෙහි 6 වන වගන්තියේ 'බී' උප වගන්තිය ප්‍රකාරව වෛද්‍ය වෘත්තික (Medical Practitioner) තනතුරට උසස්වීම ලබා නොදීම හා ඊට අනුරූපි වැටුප් තලයෙහි නොපිහිටුවීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඔහුට කුමන සහනයක් ලැබිය යුතු ද යන්න පිළිබඳවද වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 711/2

මගේ යොමු අංකය: IR/10/54/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එන්. සී. බන්දුරත්න මයා, අංක 5/7, ග්‍රාමිණී විද්‍යාල මාවත, කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ.

සහ

ජාතික ගමනාගමන කොමිෂන් සභාව, අංක 241, උද්‍යාන පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, අංක 213හි, එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/10/54/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එන්. සී. බන්දුරත්න මයා, අංක 5/7, ග්‍රාමිණී විද්‍යාල මාවත, කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ.

සහ

ජාතික ගමනාගමන කොමිෂන් සභාව, අංක 241, උද්‍යාන පාර, කොළඹ 05.

අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ iii ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක (ආවරණ) ලෙස සේවය කරමින් සිටි iv ශ්‍රේණියේ එන්. සී. බන්දුරත්න මහතා හට ආයතනයේ iii ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවා ගැනීමේදී උසස්වීම ලබා නොදීම තුළින් යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එසේ වූයේ නම් ඔහුට හිමි විය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 712

මගේ යොමු අංකය: IR/15/43/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ඩී. එච්. පතිරණ මයා, අංක 207, වැලි පාර, දිගන විලේජ්, රජවැල්ල, දිගන

සහ

තැප්‍රෝබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 50, රජ මාවත, ඇතුල් කෝට්ටේ පාර, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

පිළියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89/එෆ් හි, සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/15/43/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩී. එච්. පතිරණ මයා, අංක 207, වැලි පාර, දිගන විලේජ්, රජවැල්ල, දිගන

සහ

තැප්‍රෝබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 50, රජ මාවත, ඇතුල් කෝට්ටේ පාර, නුගේගොඩ.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

තැප්‍රෝබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන ලද ඩී. එච්. පතිරණ මහතාට 2007 ඔක්තෝබර් මස සිට 2009 සැප්තැම්බර් මස දක්වා එකඟ වූ වැටුප් හා දීමනා ලබා නොදීම යුක්ති සහගත ද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 - 713

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.